# ඵලදායිතා සම්මාන
# 2016

## නැගෙනහිර පළාත් සභාව

# 1.0 හැඳින්වීම

1.0 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජාතික ඵලදායිතා තරඟ ආර්ථික සංවර්ධනය අරමුණු කොටගෙන ජාතික ඵලදායි ලේකම් කාර්යාලයෙන් පවත්වනු ලැබේ. මේ අනුව නැගෙනහිර පළාතේ මෙම තරඟය ආරම්භ කරන මෙන් නැගෙනහිර පළාත් අමාත්‍ය මණ්ඩලයෙන් ලබාදෙන ලද උපදෙස් ප්‍රකාරව 2014 වසරේ පළාත් ඵලදායිතා තරඟ පවත්වන ලදි. මෙහිදි සම්මාන ලැබූ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට ත්‍යාග ප්‍රධානෝත්සවය ද 2014.09.05 වැනි දින පවත්වන ලදි.

මෙම තරඟ මගින් නැගෙනහිර පළාත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල නිලධාරින් මධ්‍යයේ ඵලදායිතාවය වැඩිදියුණු කිරිමේ පළමුවන පියවර ගනු ලැබීය. තරඟ පැවැත්වීම මගින් නැගෙනහිර පළාතේ සේවා සහ මානව සම්පත්, ආකර්ෂණීය වැඩ කටයුතු සහ පරිසරය යනාදිය සාර්ථක ව්‍යුහයක් ලෙස ගොඩනැගීමට පදනමක් විය. තවදනැගෙනහිර පළාතේ කාර්යක්ෂම දෙපාර්තමේන්තු හා නිලධාරි කණ්ඩායම් යනාදිය හඳුනාගෙන ඇති අතර,අනෙකුත් නිලධාරි කණ්ඩායම් දිරිමත් කර ඇත. මෙම තරඟවල ප්‍රතිලාභ පළාත් මට්ටමින් දක්ෂ දෙපාර්තමේන්තු හා නිලධාරින් නිර්මාණය කිරිම මගින් ජාතික සංවර්ධනයේ අපගේ නැගෙනහිර පළාතේ දායකත්වය මගින් යහපත් රාජ්‍ය පාලනයක් ගොඩනැගීමට ප්‍රයෝජනත්ව පවති.

# 2.0 නැගෙනහිර පළාත් ඵලදායිතා සම්මාන තරඟාවලියේ අරමුණු

- තත්ත්වය, ඵලදායිතාව හා සේවාව වැඩිදියුණු කර යහපත් පරිචයන් අනුගමනය කිරිම සඳහා සියලුම පළාත් රාජ්‍ය ආයතන දිරිමත් කිරිම.
- පළාත් මට්ටමේ සංවර්ධනය වැඩිදියුණු කර ක්‍රියාශීලි ලෙස දායකවෙමින් නැගෙනහිර පළාත් ජනතාවගේ ජීවන මට්ටම උසස් කරලීම මගින් ජාතික සංවර්ධනයට දායකවීම.
- ආදර්ශමත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය සේවකයින් හඳුනා ගැනිම හා පළාත් මට්ටමෙන් ඇගයීමට ලක් කිරිම.
- සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරිමට ආයතන පුහුණු කිරිම මගින් “ තිරසාර සංවර්ධනය”හරහා අනාගත ගෝලීය අභියෝගයන්ට මුහුණ දීමට නැගෙනහිර පළාත් රාජ්‍ය ආයතන සූදානම් කිරිම.
- නැගෙනහිර පළාත් රාජ්‍ය ආයතන ශ්‍රේණිගත කිරිම මගින් ජනතා හිතවාදී ආයතන පද්ධතියක් බිහි කිරිම.

## 3.0 ආයතන වර්ගීකරණය

නැගෙනහිර පළාතේ සියලුම පළාත් රාජ්‍ය ආයතන පළාත් ඵලදායිතා තරඟාවලිය සඳහා පහත සඳහන් පදනම මත වර්ගීකරණය කරනු ලැබේ.

1. නැගෙනහිර පළාත් අමාත්‍යාංශ අතර
   - ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,ප්‍රධාන ලේකම් කාර්යාලය,සභා ලේකම් කාර්යාලය, අමාත්‍යාංශ, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාල
2. නැගෙනහිර පළාත් දෙපාර්තමේන්තු අතර
   - පළාත් මට්ටමේ දෙපාර්තමේන්තු, අධිකාරි
3. නැගෙනහිරපළාත් ප්‍රාදේශීය ( Regional) ආයතන අතර
   - ප්‍රාදේශිය පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල, දිස්ත්‍රික්ක මට්ටමේ ආයතන
4. නැගෙනහිර පළාත් ප්‍රාදේශීය මට්ටමේ (Divisional)ආයතන
   - සෞඛ්‍ය ක්ෂේත්‍රය -MOH Level (සෞඛ්‍ය වෛද්‍ය අධිකාරි කාර්යාල මට්ටම )
   - අධ්‍යාපන ක්ෂේත්‍රය -Zonal Level ( කලාප කාර්යාල මට්ටම )
   - පළාත් පාලන ක්ෂේත්‍රය - Municipal Council, Urban Council, Pradeshiya Sabha ( මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා )

## 4.0සම්මාන වර්ගීකරණය

ස්ථානීය පරික්ෂාවේ දි ලබා ගන්නා ලකුණු මට්ටම අනුව ආයතන සඳහා සම්මාන පිරිනැමේ.

| | | |
|---|---|---|
| A ශ්‍රේණිය | - | 850 ට වඩා වැඩි ලකුණු ලබා ගන්නා ආයතන |
| Bශ්‍රේණිය | - | ලකුණු 750 – 849 අතර වූ ආයතන |
| Cශ්‍රේණිය | - | ලකුණු 650 – 749 අතර වූ ආයතන |
| විශේෂ කුසලතා | - | ලකුණු 550 – 649 අතර වූ ආයතන |
| කුසලතා | - | ලකුණු 450 – 549 අතර වූ ආයතන |

මෙම ලකුණු පරාසයන් නැගෙනහිර පළාතේ ඵලදායිතා සම්මාන තරඟාවලියේ උපදේශක කමිටුවේ නිර්දේශ මත වෙනස් විය හැක.

A ශ්‍රේණිය ,Bශ්‍රේණිය, Cශ්‍රේණිය, යන ස්ථාන ලබාගන්නා ආයතනවලට සම්මාන සහ සහතික ලබාදෙන අතර, විශේෂ කුසලතා මට්ටම් ලබාගන්නා ආයතන සඳහා සහතික පමණක් ද පිරිනැමේ.

## 5.0අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස්

5.1 මෙම තරඟය සඳහා අයදුම්පත මේ සමඟ අමුණා ඇත. එම අයදුම්පත එලෙසම පිටපත් කර හෝ මුද්‍රණය කොට අසා ඇති නිර්ණායක සඳහා තොරතුරු / කරුණු සාධක සපයන්න.

5.2 අවශ්‍ය අවස්ථාවක දී පමණක් අතිරේක තොරතුරු සැපයීම සඳහා ප්‍රධාන ඇමුණුවලින් පසු අමතර ඇමුණුම් ඉදිරිපත් කරන්න.

5.3 අයදුම්පත පහත සඳහන් උපදෙස් අනුව සකස් කළයුතු වේ.

- ❖ ඇමුණුම් රහිත උපරිම පිටු 100
- ❖ ඇමුණුම් උපරිම පිටු 100
- ❖ අකුරේ ප්‍රමාණය (Font Size) – 11
- ❖ පිටු අංකය : දකුණු පස ඉහළ කෙලවර
- ❖ භාෂාව : දෙමළ / සිංහල

5.4 අවශ්‍ය වැඩි විස්තර සඳහා,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පිරිස් හා පුහුණු
කන්නියා පාර,
වරෝදයනගර්
ත්‍රිකුණාමලය

දුරකථනය : 026 / 2050605
ෆැක්ස් : 026 / 2222296
විද්‍යුත් තැපැල :hrd@ep.gov.lk

## 6.0අයදුම්පත් භාරදීම

සම්පූර්ණ කරන ලද අයදුම්පත පිටපත් 2 කින් යුක්තව 2016 අගෝස්තු මස 15 වන දිනට පෙර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පිරිස් හා පුහුණු කාර්යාලය වෙත පැමිණ භාරදිය හැක. තවද තැපැලෙන් හෝ සීඝ්‍රදූත සේවය මගින් නියමිත දිනට පෙර එවිය යුතු වේ. කෙසේ වෙතත් 2016 අගෝස්තු මස 15 වැනි දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් එවීමේදී පහත සඳහන් කරුණු අවධාරණය ගත යුතු වේ.

- ❖ අයදුම්පත තැපැලෙන් එවීමේ දී මුද්දරය ඇලවූ කවරයේ ඉහළින් “ රහසිගතයි ” යනුවෙන් ද වම්පස ඉහළ කෙළවරෙහි නැගෙනහිර පළාත් ඵලදායිතා සම්මාන - 2016 වනුවෙන් ද සටහන් කොට එවිය යුතු ය.

- 2016 එලදායිතා තරඟාවලිය සඳහා අයදුම්පත සහ ඵලදායිතා මඟපෙන්වීම්, අත්පොත යනාදිය නැගෙනහිර පළාත් http:// www.ep.gov.lk/දරණ වෙබ් අඩවිය ඔස්සේ පිවිස බා ගත කරන්න.

- පළමුවනඅයදුම්පත සමඟ ලියාපදිංචි කිරිමේ ගාස්තුව වශයෙන් රු.5,000/- ක් වටිනා චෙක්පතක් අමුණා එවිය යුතුවේ. චෙක්පත " නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුදල්, නැගෙනහිර පළාත "යන නමට ලියා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පිරිස් හා පුහුණු කාර්යාලය වෙත එවිය යුතු වේ. එමෙන්ම චෙක්පත දින 60 කට වලංගු වන සේ ලිවීම අත්‍යාවශ්‍ය වේ.

- ලියාපදිංචි ගාස්තුව නොමැතිව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- 2016 එලදායිතා ඇගයීම සම්බන්ධ අයදුම්පත ( ඇමුණුම - 02) 2017 ජනවාරි මස 27 දිනට පෙර එවිය යුතු වේ.

- අසම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කරන ආයතනවලට ලකුණු අඩු විය හැකිය.

- වාර්තාව සැකසිමේදි සෑම මිණුම් දණ්ඩක් සම්බන්ධයෙන් නිසි විස්තර දැක්විය යුතු අතර එලෙස තරුණු නොමැති නම් එය හිස්ව තබන්න.

- අසත්‍ය තොරතුරු සපයා, ක්ෂේත්‍ර පරික්ෂාවේ දී ඒවා වැරදි බවට තහවුරු වුවහොත් ලකුණු අඩුවිය හැකිය.

## 7.0අයදුම් කිරිමේ සහ ඇගයීමේ ක්‍රියාවලිය

ඇගයීම් ක්‍රියාවලිය කොටස් දෙකකි.

### 7.1 සමාලෝචන අදියර 1 - ඉදිරිපත් කළ අයදුම්පත් සමාලෝචනය කිරිම.

පළමුවන අදියරයේ ඉදිරිපත් කරන සියලුම වාර්තා තාක්ෂණික කමිටුවක් මගින් සමාලෝචනය කිරිම ප්‍රථම අදියරේ දි සිදු කෙරේ. එහි දි නිසි ප්‍රමිතියකින් තොර වාර්තා ප්‍රතික්ෂේප කර අනෙකුත් වාර්තා සඳහා මූලික ලකුණු ලබා දීමක් සිදු කරයි. ඉන් පසු තීරණය කරන කඩඉම් ලකුණු ප්‍රමාණය අඩු ආයතන තරඟ සඳහා සුදුසුකම් නොලබයි. වාර්තාව සම්පූර්ණ නම් ආයතනය කුමන මට්ටමේ ප්‍රගතියක් ලබා තිබුන ද සියලුම තොරතුරු වාර්තාවේ ඇතුළත් නොමැති විට, එම ආයතනය තරඟය සඳහා සුදුසුකම් අහිමි වූ බව සැලකේ. අනාගතයේ ඉටු කිරිමට බලාපොරොත්තු වන කටයුතු වාර්තාවට ඇතුළත් නොකළ යුතු ය. පවතින තත්ත්වය පමණක් වාර්තාවට ඇතුළත් කළ යුතු ය.

## 7.2 සමාලෝචන අදියර 2 - ස්ථානීය පරීක්ෂාව.

මේ සඳහා සුදුසුකම් ලැබූ ආයතන විද්වත් මණ්ඩලයක් මගින් ස්ථානීය පරීක්ෂාව සිදු කර අවසාන ලකුණු ලබා දේ. මෙම ලකුණු පදනම් කරගෙන සම්මානලාභීන් තෝරාගන්නා අතර, තේරීම් කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

සටහන :

සම්මාන සඳහා අයදුම් කරන ආයතන මූලික සමාලෝදනයේ දි ලබාගන්නා ලකුණු පදනම් කරගෙන වැඩ බිම පරික්ෂා කළ යුතු සීමාව තීරණය කෙරෙන අතර, අදාළ වැඩ බිම් " විශේෂඥ පරීක්ෂක කමිටුවක් " මගින් පරීක්ෂා කරනු ලැබේ. මෙම නිරීක්ෂණයේ මූලික අරමුණු වන්නේ අයදුම්පත සහ වාර්තාවේ සඳහන් තොරතුරු සත්‍යාපනය කිරිම හා වාර්තාව සමාලෝචනයේ දී මතු වන ගැටලු හා කරුණු පැහැදිලි කර ගැනිම විනා මූලික වැඩ බිම සම්පූර්ණයෙන් පරික්ෂා කිරිම නොවේ. එහෙයින් වාර්තාවේ සඳහන් කොට නොමැති කරුණු සම්බන්ධයෙන් වැඩ බිම පරීක්ෂණයේ දි ලකුණු ලබාදීමට බැඳීමක් නොමැත. එහෙයින් ඉදිරිපත් කළ හැකි සියලුම කරුණු වාර්තාවට ඇතුළත් කොට කිබීම අත්‍යවශ්‍ය වන බව සැලකිය යුතු වේ.

වැඩ බිම පරික්ෂණයේ දි එකී කණ්ඩායම සමඟ සම්මුඛ පරීක්ෂාවක් කිරිමත් වාර්තාවේ සඳහන් කරුණුවල පැවැත්ම තහවුරු කිරිමට සාධක ප්‍රදර්ශනය කිරිමත් කළ හැකි අතර, වාර්තාවට ඇතුළත් නොවන අවසන් මොහොතේ කරනු ලබන ක්ෂණික වර්ධනයන් සඳහා ලකුණු ලබා ගැනීමට හැකියාව නොමැති බව සැලකිය යුතුය.

එම ආයතන පරීක්ෂාවට පැමිණෙන විනිශ්චය මණ්ඩලයට අවශ්‍ය පහසුකම් සැපයීමට අදාළ ආයතන කටයුතු කළ යුතු වන අතර, විනිශ්චය මණ්ඩලයේ සාමාජිකයන් හට ත්‍යාග පිරිනැමීමෙන් හෝ වෙනත් පුද්ගලික වරප්‍රසාද ලබාදීම හෝ පුද්ගලික සම්බන්ධතා පැවැත්වීම සිදු නොකළ යුතු ය. තවද, අයථා මාර්ග මගින් ප්‍රතිඵල ලබා ගැනීමට උත්සාහා නොකිරිමට ද තරයේ වග බලා ගත යුතු ය. ආයතන පරීක්ෂාවේදි මූලික වශයෙන් පරීක්ෂණ මඩුල්ල සම්මුඛ සාකච්ඡා මෙහෙයවන අතර, අදාළ වාර්තා හා දත්ත සමාලෝචනය කරනු ලබයි. හඳුන්වා දීමේ කෙටි ඉදිරිපත් කිරිමකට අයදුම්කරුවන්ට ඉඩ ලබා දෙනු ලැබේ.

# 8.0සම්මානලාභීන් ප්‍රකාශයට පත් කිරිම

වර්ෂ 2017 ජූලි මස තුළ දි ප්‍රතිඵල නිකුත් කරන අතර, නැගෙනහිර පළාත් සම්මාන උළෙල 2017 අගෝස්තු මාසයේ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

ජයග්‍රහණ ලබා ඇති ආයතනවලට ඒ බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පිරිස් හා පුහුණු කාර්යාලය විසින් දැනුම් දෙනු ලබන අතර එය නිල ප්‍රතිඵල වනු ඇත. නිල නොවන ප්‍රතිඵල පිළිබඳවනියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පිරිස් හා පුහුණු කාර්යාලයේ වගකීමක් නොමැති අතර ඒ පිළිබඳව කෙරෙන විමසීම්වලට පිළිතුරු දීමට

බැඳීමක් නොමැති බව ද දන්වා සිටිමු. ප්‍රතිඵල නිකුත් කිරිමෙන් පසු ලැබෙන පැමිණිලි, අභියාචනා සම්බන්ධව ක්‍රියා කිරිමට අවස්ථාවක් නොමැති බව ද අවධාරණය කරනු ලැබේ.

ජාතික ඵලදායිතා සම්මාන 2016 ඇගයීම් මිණුම් දඬු සහ ලකුණු දීමේ ක්‍රමය.

| **නිර්ණායකයන්** | **ලකුණු** |
|---|---|
| නායකත්වය | 200 |
| බලදායකයින් | 300 |
| ක්‍රියාවලිය වැඩි දියුණු කිරිම | 200 |
| සේවාලාභී තෘප්තිය මැනීම | 100 |
| ප්‍රතිඵල | 200 |
| **මුළු ලකුණු** | 1000 |